NATIONS UNIES
DROITS DE L'HOMME
HAUT-COMMISSARIAT

UNITED NATIONS
HUMAN RIGHTS
OFFICE OF THE HIGH COMMISSIONER

HAUT-COMMISSARIAT AUX DROITS DE L'HOMME • OFFICE OF THE HIGH COMMISSIONER FOR HUMAN RIGHTS
PALAIS DES NATIONS • 1211 GENEVA 10, SWITZERLAND
www.ohchr.org • TEL: +41 22 917 9000 • FAX: +41 22 917 9008 • E-MAIL: registry@ohchr.org

# මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලයේ (OHCHR) ශ්‍රී ලංකාව පිළිබඳ පරීක්ෂණය මානව හිමිකම් කවුන්සිලයේ A/HRC/25/1 යෝජනාව මගින් පවරන ලද විධි නියෝගය අනුව ඉදිරිපත්කිරීම් කැඳවීම

2014 අගෝස්තු 01

## පසුබිම

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය (HRC) යනු ලොව පුරා මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ පද්දතිය තුල පවත්නා ඉහළම අන්තර් ආන්ඩු ආයතනය වේ.

2014 මාර්තුවේ දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය, මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලයට "උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසමෙන් ආවරණය කරන ලද කාලය තුල දෙපාර්ශයෙන්ම සිදුවී ඇතැයි කියන බරපතල මානව හිමිකම් කඩවීම් සහ අපහරණ හා ඒ ආශ්‍රිත අපරාධ පිළිබඳව, පුළුල් පරීක්ෂණයක් කිරිමට බාර ගන්නා ලෙසත් එහිදී දණ්ඩ මුක්තිය වැළැක්වීම හා වගවීම සහතික කරනු සඳහා සිදුවි ඇතැයි කියන මෙම උල්ලංසනයන් සහ අපරාධයන්ට අදාළ සිදුවීම්වලට අදාළ කරුණු හා සිද්ධින් නිර්ණය කරන ලෙසත්" නිර්දේශ කරමින් **A/HRC/**25/1 යෝජනාව සම්මත කළා ය.

මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ පරීක්ෂණයෙහි (OISL) විධි නියෝගයට අන්තර් ජාතික මානව හිමිකම් නීතිය උල්ලංගනය සහ අපහරණය කිරීම් සහ අන්තර් ජාතික මානුෂීය නීතිය කෙළෙසීම් මෙන්ම ඊට අදාළ අපරාධයන් ද ඇතුළත් වේ.

මෙකී යොජනාවට අනුව මානව හිමිකම් පිළිබඳ මානව හිමිකම් එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයා විසින් ශ්‍රී ලංකාව පිළිබඳ මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ පරීක්ෂණය (OISL) පිහිටුවා තිබේ. A/HRC/25/1 යෝජනාවට අනුව එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයා විසින් පත්කරන ලද මර්තා අර්තිසාරී මහතා, සිලිවියා කාට්රයිට් මහත්මිය සහ අස්මා ජහින්ගිර් මහත්මිය යන කිර්තිධර විශේෂඥයින් තිදෙනා ශ්‍රී ලංකාව පිළිබඳ මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ පරීක්ෂණයට මුලු කාලය පුරාම උපදෙස් දෙමින් සහාය වනු ඇත.

මානව හිමිකම් පිළිබඳ මානව හිමිකම් එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයා 2015 මාර්තුවේ දී මානව හිමිකම් කවුන්සිලයට පරීක්ෂණය පිළිබඳ සර්ව සම්පූර්න ලිඛිත වාර්තාවක් ඉදිරිපත් කරනු ඇත.

## OISL පරීක්ෂණයට කරුණු ඉදිරිපත් කිරීම

2002 පෙබරවාරි 21 දි සිට 2011 නොවැම්බර් 15 දා දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකාවේවෙහි දී සන්නද්ධ අරගලයේ පාර්ශවයන් දෙකෙන් කවරක් විසින් හෝ කරන ලදැයි කියන බරපතල මානව හිමිකම් කෙළෙසීම් සහ අපහරණයන් ද ඒ හා සම්බන්ධ අපරාධයන් ද සම්බන්ධයෙන් තොරතුරු සහ/හෝ ලියැවිලි ඉදිරිපත් කරන ලෙස පුද්ගලයින්ට, සංවිධානයන්ට සහ ආන්ඩුවලට ආරාධනය කරනු ලැබේ.

ඉදිරිපත් කිරීම් 2014 ඔක්තෝබර් 30 දින ජිනීවා වේලාවෙන් මධ්‍යම රාත්‍රියට පෙර කළ යුතු ය. මෙයට හේතුව නම් පරීක්ෂන කන්ඩායමට වාර්තාව කෙටුම්පත් කිරීමට පෙර, එක් කර ගන්නා ලද සියලු තොරතුරු විශ්ලේෂණය කිරීමට කාලය ලබා ගැනීම පිණිස ය. මාර්තු මාසයේ දී වාර්තාව මානව හිමිකම් කවුන්සිලයට පිළිගැන්වීමට අඩුම වශයෙන් දෙමසකට පෙර කෙටුම්පත් කිරීම අවසන් කළ යුතු ය.

## ඉදිරිපත් කිරීම් සඳහා පටිපාටිය

ඉදිරිපත් කිරීම් ලිඛිතව එවිය යුතු අතර එහි එහි කතුවරයා හෝ කතුවරයින්ගේ සම්බන්ධතා තොරතුරු සඳහන් විය යුතු ය. ඉදිරිපත් කිරීම් කරන ආයතන හෝ පුද්ගලයින් විසින් එම ඉදිරිපත් කිරීම්හි කොටසක් හෝ සම්පූර්නයෙන් ම හෝ රහස්‍ය ලෙස සැළකිය යුතු නම් ඒ බව විශේෂ කොට සඳහන් කළ යුතු ය. ඉදිරිපත් කිරීම් ලද පසු මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්‍යාලය කතුවරුන්ගේ සහ ඉදිරිපත් කිරීම්හි සඳහන් නම් අන් කවර හෝ පුද්ලයින්ගේ පුද්ගලික තොරතුරුහි රහස්‍යභාවය සුරැකීමට අවශ්‍ය සියලු පියවර ගන්නවා ඇත.

ඉදිරිපත් කිරීම් ඉංග්‍රිසි හෝ සිංහල හෝ දෙමළ යන කවර හෝ භාෂාවකින් ඉදිරිපත් කළ හැකි ය. ඒවා පිටු 10කට නොවැඩි විය යුතු ය. ශ්‍රී ලංකාව පිළිබඳ මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්‍යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ පරීක්ෂණය (OISL) සඳහා වැඩි විස්තර අවශ්‍ය වන්නේ නම් එය කතුවරයා හෝ කතුවරුන්ට දන්වනවා ඇත. ඉදිරිපත්කිරීම් වලට සම්බන්ධ ශ්‍රව්‍ය, දෘෂ්‍ය හෝ ඡායාරූපමය ද්‍රව්‍ය විද්‍යුත් තැපැල හරහා නොඑවිය යුතු ය. එවැනි ද්‍රව්‍ය විකල්ප ක්‍රම මගින් එවීම පිණිස ශ්‍රී ලංකාව පිළිබඳ මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්‍යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ පරීක්ෂණය (OISL) ට දන්වන්න.

ඉදිරිපත් කිරීම් සඳහා විද්‍යුත් සහ තැපැල් ලිපිනයන් මෙසේ ය:

විද්‍යුත් ලිපිනය: OISL_submissions@ohchr.org
තැපැල් ලිපිනය: OISL
UNOG-OHCHR
8-14 Rue de la Paix
CH-1211 Geneva 10
Switzerland

මානව හිමිකම් කවුන්සිලයේ යෝජනාව, ශ්‍රී ලංකාව පිළිබඳ මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්‍යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ පරීක්ෂණයෙහි (OISL) විශය ක්ෂේත්‍රය සහ අනෙක් තොරතුරු සඳහා මෙහි පිවිසෙන්න: http://www.ohchr.org/EN/HRBodies/HRC/Pages/OISL.aspx